# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2312/05 – 2022 දෙසැම්බර් මස 27 වැනි අඟහරුවාදා – 2022.12.27**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/46.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.11.25 දිනැති හා අංක 2203/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2020.10.26 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අලුත්ගම, සීනවත්ත, රෝහල පාර, අංක 85/5 හි පදිංචි අයි.බී. ප්‍රනාන්දු මහතා, සහ කොළඹ 07, නිදහස් චතුරශ්‍රය හි පිහිටි ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.11.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 38424– 18 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

**බේරුම්කරු : ඩී. ජී. කේ. කරුණාරත්න මහතා ඉදිරිපිට දී ය.**

1. අයි.බී. ප්‍රනාන්දු,
අංක 85/5, රෝහල පාර,
සීනවත්ත - අලුත්ගම,

*පළමුවැනි පාර්ශ්වය.*

ගොනු අංකය: IR/COM/01/2019/46.
*බේරුම්කරණ අංකය* : A/61/2020.

*සහ,*

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවතින කාර්මික ආරාවුල,

කම්කරු අමාත්‍ය, නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ:

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වතුපාලක ලෙස සේවය කරන අයි. බී. ප්‍රනාන්දු මහතා හට වතු පාලක තනතුර පිරිනමමින් ඊට අදාල සේවය ලබා ගත්ත ද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පාලන අංශය විසින් එම තනතුර අනුව හිමිවිය යුතු වැටුප් කාණ්ඩයේ නොපිහිටුවීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී ඇත් ද යන්නත් එසේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

*මෙයට අදාල කාර්මික ආරවුලට පාදක වී ඇත්තේ :*

I. ඉල්ලුම්කරුට වතු පාලක තනතුර පිරිනමමින් ඊට අදල සේවය ලබා ගත්ත ද එම තනතුර හිමි වැටුප නොගෙවීම නිසා ඔහුට අසාධාරණයක් වී ඇති බවයි.

II. ඉල්ලුම්කරු 1991.06.14 දින අනියම් කම්කරුවකු ලෙසින් ගුවන් විදුලි සංස්ථාවට සේවයට බැඳුනු බවත් කම්කරු පරිපාලක

වශයෙන් තාවකාලික තනතුරකට පත් කළ බවත් 1997 දී පුස්තකාල සේවක තනතුරක් ලබා දුන් බවත් ඉන් පසුව වතුපාලක හා ගොඩනැගිලි පරීක්ෂක වශයෙන් පත්කළ බවත් 2013.04.05 දින සිට වතු පාලක තනතුරේ සේවය කරන බවත් එම්.එම් වැටුප් තලයේ වැටුප් වර්ධක, අර්ථ සාධක හා භාරකාර මුදල් රාජකාරි වෘත්තීය දීමනා, දුරකථන දීමනා, දිරි දීමනා කිසිවක් නොලැබීම යන ප්‍රධාන කරුණු වේ.

**පෙනී සිටීම.**

පළමු පාර්ශ්වය වෙනුවෙන් :
නියෝජිත එස්.පී. විජේමාන්න මහතා
දෙවන පාර්ශ්වය වෙනුවෙන් :

01. සහකාර අධ්‍යක්ෂක (පිරිස්) සුමිත්‍රා ප්‍රනාන්දු මහත්මිය
02. නීති නිලධාරිනී - චම්පා විජේවර්ධන මහත්මිය
03. සහකාර අධ්‍යක්ෂක (පිරිස් )ප්‍රවීන් ප්‍රනාන්දු මහත්මිය
04. නීතිඥ - පියුමි ජයවික්‍රම මහත්මිය
05. නීතිඥ - හංසනී ජයවික්‍රම මහත්මිය

දෙවන පාර්ශ්වය සිය ප්‍රථම ප්‍රකාශයේ 2021.03.18 වන දින භාරදී ඇති අතර පළමු පාර්ශ්වය තම පළමු ප්‍රකාශයේ 2012.03.19 වැනි දින ඉදිරිපත් කර ඇත.

පළමු පාර්ශ්වය විසින් සිය පළමු ප්‍රකාශයේ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2021.11.09 වන දින දෙවන පාර්ශ්වය විසින් සිය පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි.

මෙම නඩු විභාගය 2021.02.16 වන දින ආරම්භ කොට 2022. 09.27 වන දින අවසන් කරන ලදී.මෙය නිම කිරීම සඳහා වසරකට වැඩි කාලයක් ගත වී ඇත්තේ කොවිඩ් 19 වසංගතය නිසා රට වසා දැමීම හා එම හේතුවෙන් වරින් වර කාර්යාලය වසා තැබීම නිසාත් වගඋත්තරකාර පාර්ශ්වය විසින් සමථයකට එළඹීම සඳහා කැමැත්ත ප්‍රකාශ කර සිටිය ද නඩු වාර 5ක් ගත වෙන තුරු ඊට නිසි පිළිතුරක් නොදී කල් ඇරීම නිසා යන කරුණු මතය.

ලිඛිත දේශන භාරදීම.

පළමු පාර්ශ්වය විසින් තම ලිඛිත දේශනය 2022.09.27 වන දින භාරදුන් අතර දෙවන පාර්ශ්වය විසින් සිය ලිඛිත දේශනය 2022.10.11 වන දින භාර දෙන ලදී.

**ප්‍රදානය**

<u>පළමු පාර්ශ්වයේ ඉල්ලීම</u>

පළමු පාර්ශවය විසින් දිගින් දිගටම ඉල්ලා සිටින ලද්දේ , 2013.04.05 වන දින ඉල්ලුම්කරු වතුපාලක තනතුරට පත්කළ බවත් එම පත්වීම අනුව තමා M M 1 වැටුප් තලයේ පිහිටුවිය යුතු බවත් ඊට අදාල වැටුප් වර්ධක, අර්ථසාධක, භාරකාර අරමුදල් , රාජකාරි හා වෘත්තීය දීමනා දුරකථන දීමනා හා දිරි ගැන්වීමේ දීමනා ලබාදිය යුතු බවයි.

<u>දෙවන පාර්ශ්වයේ පිළිතුර වූයේ</u>

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පළමු පාර්ශ්වය සඳහා M M 1-1 වැටුප් කාණ්ඩය ලබා දීමට හැකියාවක්
නොමැති බවයි.

2021.02.16 වන දින මෙම නඩුව පළමු වරට කැඳවූ අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශ්වය නොපැමිණීම නිසා කල් තැබීමට සිදුවිය. මීළඟට 2021.03.19 දින පැවැත්වූ සැසි වාරයේ දී වගඋත්තරකාර පක්ෂය යෝජනා කරමින් කියා සිටියේ මෙම ආරවුල සමථයකින් විසඳා ගැනීමට සලකා බැලීමට උත්සහ කරන බැවින් ඒ සම්බන්ධයෙන් තීරණයක් මීළඟ සැසිවාරයේ දී ප්‍රකාශ කළ හැකි බවයි. එහෙත් 2021.04.21 දින පැවැත් වූ නඩු විභාගයේ දී හබකර සිටියේ සංස්ථා මණ්ඩලය ඉල්ලා අස් වී ඇති බැවින් එය නැවත පත්කරන තුරු තීරණයක් ගැනීමට කොහැකි බවයි. මීළඟ නඩු දිනයේ දී ඒ ගන්නා තීරණය දැනුම් දීමට කටයුතු කරන බවයි.

2021.11.09 වන දින සහභාගි වූ සැසිවාරයේදී වගඋත්තරකාර පාර්ශ්වය සිය සමථය පිළිබඳව දැනුම් දී ම සඳහා තවත් සති දෙකක කාලයක් අයැද සිටින්නේය. මීළඟට 2021.11.17 දින පැවැත්වූ සැසිවාරයේ දී සිය පිළිතුරක් දෙවන පාර්ශ්වය විසින් අධිකරණයට හෙළි කලේ නැත. 2021.12.01 දින පැවැත්වූ ඊලග සැසිවාරයේ දී පවා ඒ පිළිබඳව නිසි පිළිතුරක් නොලැබුණු නිසා ඉල්ලුම්කාර පාර්ශ්වය ඉල්ලීම පරිදි නඩුව ආරම්භ කරමින් ඉල්ලුම්කරුගේ සාක්ෂි මෙහෙයවීමට අවස්ථාව ලබාදෙන ලදී.

මෙම බේරුම්කරණයේ දී පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කාර අයි. බී. ප්‍රනාන්දු මහතාගෙන් සාක්ෂි මෙහෙයවන ලදී.

1991.06.14 වන දින තමා ගුවන් විදුලි සංස්ථාවට අනියම් කම්කරු පරිපාලකවරයෙකු ලෙස සේවයට බැඳුණු බවත් පසුව කම්කරුවෙකු වශයෙන් ස්ථිර පත්වීමක් ලැබුණු බවත් 1997.02.17 දින පුස්තකාල සේවකයෙක් වශයෙන් පත්කළ බවත් එම තනතුර ලැබුනත් වැටුප් වැඩි වීමක් සිදු නොවූ බවත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කරයි.

2011.02.11 දින සිට වතුපාලක හා ගොඩනැගිලි පරීක්ෂක වශයෙන් පත්කළ අතර ඊට ද වැටුප් වැඩි කිරීමක් සිදු නොකළ බැවින් දැනට වතු පාලක තනතුර දරන බවත් එම තනතුරට අදාල වැටුප හා අනෙකුත් හිමි වරප්‍රසාද නොගෙවන බවත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටී. මෙය සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි වශයෙන් X (1) සිට X(12) දක්වා ලේඛන ඉදිරිපත් කර ඇත.

තවත් වසර 05 ක් සේවය කිරීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය දුන් ලිපිය X (3) ලෙස ද වතුපාලක තනතුරට පත්කල ලිපිය X (4) ලෙසත් එම තනතුර ස්ථිර කල ලිපිය X (5) (A) වශයෙන්ද සාක්ෂි දෙමින් ඉදිරිපත් කර සිටී.

ඉල්ලුම්කරුට X (6) දරන ලිපිය සභාපතිතුමා වෙත 2013.10.23 දින ඉදිරිපත් කර ඇත.එම ලිපියෙන් ඔහු ඉල්ලා සිටින්නේ තමා වතු පාලක තනතුරට පත්කර ඇතත් ඊට හිමි වැටුප ලබාදී නැති බවත් එම වැටුප ලබා දෙන ලෙසයි. එහෙත් විශ්‍රාම ගන්වන තෙක් ඉල්ලුම්කරුට එම වැටුප ලබා දී නැත.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ගුවන් විදුලි සංස්ථාවේ සහකාර අධ්‍යක්ෂිකා ප්‍රවීන් මේරි ප්‍රනාන්දු මිය කියා සිටියේ 2013.02.18 වන දින පැවති සංස්ථා මණ්ඩල තීරණය අනුව ඉල්ලුම්කරුට හිමි වන්නේ වතුපාලක තනතුරයි. R (17) ලේඛනය ඉදිරිපත් කරමින් ඇය කියා සිටින්නේ එම ලැයිස්තුවේ හයවන ස්ථානයට නම සඳහන් අයි. බී. ප්‍රනාන්දු මහතා වතු පරිපාලක තනතුරේ ස්ථිර කිරීම සඳහා තීරණය කර ඇති බවයි. R 14 (A) වශයෙන් ලකුණු කරමින් ඇය සාක්ෂි දෙමින් කියා සිටින්නේ සේවක සංයුතිය අනුව වතුපාලක තනතුරක් අනුමත කර නැති බවයි. තව දුරටත් සාක්ෂි දෙමින් ඇය කියා සිටින්නේ R (11) අනුව ඉල්ලුම්කරුට උපාධියක් නොමැති නිසා MM 1-1 වැටුප් තලයේ පිහිටුවිය නොහැකි බවයි. මොහු ඉන්නේ MA 2-2 වැටුප් තලයේ ඒ නිසා පලපුරුද්දෙන් යන්න අමාරුයි සුදුසුකම්වලිනුත් ලබා දෙන්න අමාරුයි යනුවෙන් කියා සිටී. ( සාක්ෂි සටහන් 46 පිටුව)

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් අධ්‍යක්ෂ මුදල් වසන්තා පුෂ්පකුමාරි මහත්මිය සාක්ෂි දෙමින් කියා සිටින්නේ ඉල්ලුම්කරුට MA 2-2 වැටුප් ක්‍රමය හිමි බව පාලන අංශයෙන් ලබාදුන් ලිපියෙන් සනාථ වන බවයි. 2013 වර්ෂයේ සිට 2020 දක්වා අයි.බී. ප්‍රනාන්දු මහතාට වැටුප්, අතිකාල, දෛනික දීමනා, වැටුප් වර්ධක සියල්ල ගෙවා ඇති බවයි. ඉල්ලුම්කරු ඉල්ලා සිටින MM 1-1 වැටුප් තලය ගෙවීම සඳහා පත්වීම් ලිපියක් නිකුත්කර හැකි බවත් ඔහුට හිමිවන්නේ MM 2-2 බවත් සාක්ෂි දෙමින් කියා සිටී. R (21), (1) R (2) (2), ඉදිරිපත් කරයි.

ගුවන් විදුලි සංස්ථාවේ සභාපති හඩ්සන් සමරසිංහ මහතා සාක්ෂි දෙමින් කියා සිටින්නේ ඉල්ලුම්කරුට තනතුරට හිමි නියමිත වැටුප ගෙවා නැති බවයි.

නියමිත පුද්ගලයාට නියමිත කාලය තුළ නියමිත පඩියට වැටුප් ගෙවලා නැහැ. ඒකයි මෙතන තිබෙන ප්‍රශ්නය ( සාක්ෂි සටහන් පිටු අංක 23) ඉල්ලුම්කරුට නියමිත තනතුරට හිමි වැටුප ගෙවා නැති බව සභාපතිවරයා පිළිගනී. ඔහු තව දුරටත් මෙසේ කියා සිටී,

වත්ත සුද්ද කරන්න මෙහෙම පරිපාලන සුදුසුකම් තිබෙන අය අරගෙන වැඩක් නැහැ. ඇගේ පතේ ශක්තිය පළපුරුද්ද ඒ වගේ දේවල් බලලා වත්තේ වැඩට දැම්මේ. (සාක්ෂි සටහන් 23 පිටුව)

ඒක ගෙවපු කමිටුවෙන් අහන්න ඕන ඒවා හරියට කරලා නැති හින්ද තේ නියම තනතුර දීලා ඒ වැඩ කළානම් අතිකාල ගෙවන්න වෙන්නේ නැහැ. (සාක්ෂි 23 පිටුව)

ප්‍ර : ඉල්ලුම්කාර පාර්ශ්වය ඉල්ලා තිබෙන්නේ තමන්ගේ ශ්‍රේණියට අදාල වැටුප ලබාදෙන්න කියලා පත්වීම් ලිපියට අනුව MA 2-2 වැටුප නේද?

උ : ඊට ඉස්සරල නේද පත්කරලා තිබෙන්නේ මෙම පත්කරන කොට MA කියලා තිබුණේ නැහැ. පැරණි ක්‍රමය තමයි තිබුණේ (සාක්ෂි සටහන් 10 පිටුව)

ප්‍ර : ඉතාමත් විශාල මුදලක් ඔබ ආයතනය විසින් ඒ මහතාට ගෙවා තිබෙන බව ඔබ දන්නවා ද?

උ : දන්නවා, ඒ හින්දා තමයි මම කියලා තිබුණේ මෙයාට මෙම නිත්‍ය තනතුර දෙන්න කියලා. (සාක්ෂි සටහන් 16 පිටුව)

ඔහුට හිමි තනතුරේ අදාල වැටුප ගෙවන ලෙස පාලන අංශයට කියා තිබූ බවද සභාපතිවරයා කියා සිටී.

ප්‍ර : මහත්මයා පිළිගන්නවාද එක් එක් ශ්‍රේණිවලට අවම සුදුසුකම් තියෙන්නේ කියලා?

උ : එහෙම තියෙන්නේ කියලා කීවට ගුවන් විදුලි සංස්ථාව ඒක පිළිපැදලා නැහැ.(සාක්ෂි සටහන් 22 පිටුව) සභාපතිවරයා අවසන් වරට කියා සිටින්නේ "අධිකරණයේ යොමු කරන ඒ මුදල ගෙවන්න " ආදී සුදුසුකම් (සාක්ෂි සටහන් 26 පිටුව)

අධ්‍යක්ෂ ජනරාල් සමන්ත වැලිවේරිය මහතාගේ අත්සනින් යුතු අංක පා/පුලි/4564/ මා 7 හා 2013.04.05 දිනැතිව නිකුත් කර ඇති පත්වීම් ලිපියේ ඉල්ලුම්කරුගේ තනතුර දක්වා ඇත්තේ වතු පාලක ලෙසත්ය. එම ලිපිය ඉල්ලුම්කරු X (4) ලෙස ඉදිරිපත් කර ඇත. වගඋත්තරකරු එය R (1) ලෙස ද ලකුණු කර ඇත. එම ලිපියේ මෙන්ම ඔහු විශ්‍රාම ගැන් වූ ලිපියේ ද තනතුර ලෙස සඳහන් කර ඇත්තේ වතු පාලක ලෙසත්ය. එමෙන්ම ඔහු වෙත ලබා දී තිබූ R (1) (2) ලෙස ලකුණු කල කළමනාකරණ සේවා චක්‍රලේඛනය 2/2016 අනුව වැටුප් පරිවර්තනය කිරීම යටතේ වූ ලිපියේ වතු පාලක ලෙස සඳහන් කර ඇත. R (21) (1) ලෙස ලකුණු කළ ලිපියේ ද තනතුරු නාමය වතු පාලක ලෙස දක්වා ඇත.

R (23) (1) හා R (23) (2) ලෙස ලකුණු කළ වේතනාධික ගෙවීමේ ලිපි වලට ද තනතුරු නාමය වතු පාලක වශයෙන් නම් කර ඇත. තවද 2013.03.28 දින පැවති සංස්ථා මණ්ඩල රැස්වීමේ දී ඉල්ලුම්කරු වතු පාලක තනතුරට පත්කර ඇත.ඒ බව R (18) ලේඛනයෙහි සඳහන් වෙයි.

ඉහත සඳහන් කල පත්වීමේ ලිපියේ සිට විශ්‍රාම ගන්වන ලිපිය දක්වා වූ සියලුම ලිපිවල තනතුරු නාමය සඳහන් කර ඇත්තේ වතු පාලක ලෙසිනි. එසේ ඔහුට වතු පාලක තනතුර හිමි වැටුප ගෙවීම ඔහුට කළ අසාධාරණයකි. එබැවින් ඉල්ලුම්කරු වතු පාලක තනතුරට හිමි වැටුප් ක්‍රමය ලබා දෙන ලෙස නියෝග කරමි.

වගඋත්තරකාර පාර්ශ්වය ලිඛිත දේශනයේ 9 යටතේ වතු පාලක තනතුරක් සංස්ථාවේ ඇතිකර නව සේවක සංයුතියක් අනුව අනුමත කර නැත යනුවෙන් සඳහන් කර ඇත. එවැනි තනතුරක් ස්ථාපිත කර නැතිනම් ඉල්ලුම්කරු වතු පාලක තනතුරට පත්කළේ ඇයිදැයි යන ප්‍රශ්නය පැන නැගේ. වතු පාලක තනතුරට පත්කළ ලිපිය X (04) ලෙස ද R(1) ලෙසද ලකුණු කර අධිකරණයට ඉදිරිපත් කර ඇත.

සංස්ථාවේ පැවැත්මක් නොමැතිව වසර 08 ක කාලයක් බලා නොයිද ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපිය සංශෝධනය කල හැකිව තිබුණි. එහෙත් වගඋත්තරකරු ඔහු විශ්‍රාම යන තුරු සිදු කර නැත.මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බවද වගඋත්තරකාර පාර්ශ්වය සිය ලිඛිත දේශන 4 වන පිටුවේ සඳහන් කරයි. එවැනි අනුමැතියක් ලබා ගැනීම ඉල්ලුම්කරුගේ වගකීමක් නොවේ. 2013 සිට 2021 දක්වා ඒ සඳහා ඕනෑ තරම් කාලයක් තිබුණි. R(1) අනුව වතු පාලක තනතුර පිරිනමමින් ඊට හිමි වැටුප ලබා දීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවස්ථාව ලබාගැනීම සඳහා කල් මැරීම පාලන අධිකාරියේ අතපසු කිරීමකි. අදල වැටුප් තලයේ නොපිහිටුවා ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු වී ඇති බවට නිගමනය කරමි.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ගණකාධිකාරි වසන්ත පුෂ්ප කුමාර මයා නැවත ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා සිටී,

ප්‍ර : කුමන අවස්ථාවේ දී ද මහත්මිය පාලක ශ්‍රේණියේ J M 1-1 වැටුප් තලයේ සිටි සේවකයින් M M 1-1 වැටුප් තලයට ගෙනල්ලා තියෙනවා. ( සාක්ෂි සටහන් 8 වන පිටුව) ඉහත සඳහන් යෝජනා හිග වැටුප් ගෙවීමකින් තොරව වර්තමානයේ සංස්ථා මණ්ඩලය පැවැත් වූ දින සිට 2018.05.14 දින ක්‍රියාත්මක කල යුතුය. ( සාක්ෂි සටහන් 9 වන පිටුව) ඒ බව R /22 / සිටR (22) (A) ලෙස ලකුණු කළ ලේඛනයකින් තහවුරු කරයි. ඉල්ලුම්කරුවකුට මුල් පත්වීම තිබිය දී හා වැටුප් පරිවර්තන වල දී ද වේතනාධික ගෙවීම් ලිපි වලින් සහ විශ්‍රාම ගැන්වූ ලිපියෙන් ද ආමන්ත්‍රණය කර ඇත්තේ වතු පාලක යන නිල නාමයෙන් නිසා ඔහුගේ තනතුරට හිමි M M 1-1 වැටුප් තලයේ නොතිබීම ඔහුට කළ අසාධාරණයකි.

2018.09.04 වැනි දින පැවැත්වූ සංස්ථා මණ්ඩල රැස්වීමේ දී ගනු ලැබූ තීරණය අනුව R 22 (A) ලෙස ලකුණු කළ කොටසේ සඳහන් පරිදි ඉල්ලුම්කරු 2018.05.14 වන දින සිට M M 1-1 වැටුප් තලයේ පිහිටුවිය යුතු බවට නියෝග කරමි.

ඉල්ලුම්කරු අයි.බී. ප්‍රනාන්දු යන අයට 2018.05.14 වැනි දින සිට 2021.12.10 දින දක්වා M M 1-1 වැටුප් තලයේ පිහිටුවා ඊට හිමි වේතනාධික හා එම වැටුප් තලයට අදල අර්ථ සාධක හා භාරකාර අරමුදල් ලබා දීම සඳහා දෙවන පාර්ශ්වයට නියෝග කරමි. මෙසේ ගෙවීමේ දී මේ වන විටත් ඉල්ලුම්කරුට M A 2-2 ට හිමි වූ දැනට ගෙවා ඇති වැටුප අඩු කර M M 1-1 හි හා M A 2-2 හි වේතන පමණක් ගෙවන ලෙසට තීරණය කරමි.

R(22 )A ලෙස ලකුණු කර ඇති වැටුප් විෂමතා සම්බන්ධයෙන් විසඳුම් ලබා දීම මැයෙන් 2018.09.04 දින පැවති සංස්ථා මණ්ඩල තීරණය 2018.05.14 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ඉල්ලුම්කරුට M M 1-1 වැටුප් කාණ්ඩය යටතේ හිමි විය යුතු වැටුප

| | | |
|---|---|---|
| 2018 ප්‍රතික්ෂේප මාස 7ට | = | රු. 3,91,475.00 |
| 2019 ජනවාරි සිට දෙසැම්බර් | = | රු. 6,87,600.00 |
| 2020 ජනවාරි සිට දෙසැම්බර් | = | රු. 7,04,100.00 |
| 2021 ජනවාරි සිට දෙසැම්බර් | = | රු. 7,20,600.00 |
| | = | රු. 25,03,775.00 |

R 8 සිට R 10 R 23 (2) අනුව ඉල්ලුම්කරුට 2018 සිට 2021 දක්වා ගෙන ගොස් ඇති වැටුප = රු.14,43,974.00

ඉල්ලුම්කරුට රු. 14,43,974.00 ක මුදලක් ගෙවා ඇති බැවින් M M 1-1 ඔහුට හිමි විය යුතු වැටුප රු. 25,03,775.00 කි. ඒ අනුව ඔහුට හිග වශයෙන් රු. 10,59,801.00 ක් (දස ලක්ෂ පනස් නව දහස් අටසිය එකක්) ගෙවිය යුතු බවට නියෝග කරමි.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට 1991 සිට 2021 දෙසැම්බර් මාසය දක්වා දීර්ඝ කාලීන සේවාවක් ඉටු කළ ඉල්ලුම්කරුවකුට වතු පාලක යන නිල නාමයට හිමි M M 1-1 වැටුප් තලයේ පිහිටුවා ඉහත සඳහන් කළ මුදල ඔහුට ලබා ගත හැකි වන පරිදි මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පල කළ දිනයේ සිට දින 14 ක් ඇතුළත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙසට මෙයින් නියෝග කරමි.තවද මෙම ප්‍රදනය *ගැසට් පත්‍රයේ* පලකළ දින සිට මසක් ඇතුළත ක්‍රියාත්මක කර ඒ බව මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත දැනුම් දිය යුතු බව මෙයින් නියම කරමි.

තවද ඉල්ලුම්කරුට හිමි සේවක අර්ථ සාධක හා සේවා භාරකාර අරමුදල් හා අනෙකුත් දීමනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් වෙත ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවන බව ද දන්වමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවද සටහන් කරමි.

නීතිඥ ඩී.ජී.කේ. කරුණාරත්න,
බේරුම්කරු,
2022 නොවැම්බර් මස 21 වැනි දින.

---

EOG 12-0320

මගේ අංකය: IR/COM/05/2018/225.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.08.27 දිනැති හා අංක 2294/72 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.08.18 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වාද්දුව, මොල්ලිගොඩ, හබරලගහලන්ද පාර, අංක 219, ඩී හි පදිංචි එච්.එස්.එල්. පෙරේරා සහ රත්මලාන, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල පාර, අංක 100 හි පිහිටි බාටා ෂූ කම්පැනි ඔෆ් සිලෝන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.11.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

බේරුම්කරණ අංකය: A/44/2022.

ගොනු අංකය: IR/COM/05/2018/225.

එච්.එස්.එල්. පෙරේරා මහතා,
අංක 219/D,
හබරලගහලන්ද පාර,
මොල්ලිගොඩ
වාද්දුව,

*සහ,*

බාටා ෂූ කම්පැණි ඔෆ්,
සිලෝන් ලිමිටඩ්,
අංක 100,
ජනරාල් ශ්‍රීමත් ජෝන්
කොතලාවල පාර,
රත්මලාන.

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවතින කාර්මික ආරාවුල.

## ප්‍රදානය

කම්කරු අමාත්‍ය, මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2019.09.27 වන දින 2142/88 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.08.18 වන දින දරන නියෝගයෙන් බේරුම්කරුවෙකු, වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

<u>ආරවුලට තුඩු දුන් කාරණය.</u>

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව, පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලයි.

එච්.එස්.එල්. පෙරේරා මහතා,
අංක 219/D,
හබරලගහලන්ද පාර,
මොල්ලිගොඩ
වාද්දුව.

*පළමුවැනි පාර්ශ්වය.*

බාටා ෂූ කම්පැණි ඔෆ්,
සිලෝන් ලිමිටඩ්,
අංක 100,
ජනරාල් ශ්‍රීමත් ජෝන්
කොතලාවල පාර,
රත්මලාන.

*දෙවැනි පාර්ශ්වය.*

මෙම ආරවුලට හේතු වී ඇති කාරණය ලෙස, කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින්, නිකුත් කරන ලද අංක IR/COM/05/2018/225 හා 2022.08.17 දින දරන ලිපියේ සඳහන් කර ඇත්තේ,

i. "බාටා ෂූ කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් හි සේවය කරන එච්.එස්.එල්. පෙරේරා මහතා 2004.02.02 සිට ක්‍රියාත්මක වන පරිදි මැනිපියුලන්ට් තනතුරේ ස්ථිර කළ පසු,

1. අඩු වැටුප් ලබා දීම
2. මාසික වැටුප් අඩු කිරීම
3. වැටුප් පරිමාණය වැඩි නොකිරීම

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයක් කවරේද යන්න පිළිබඳ වේ."

<u>බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය</u>

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 2019.09.19 දින බේරුම්කරු වශයෙන් පී. නවරත්න මහතා පත්කර ඇත. ඒ මහතා විසින් කාර්මික අධිකරණයේ නඩු අංක A/100/2019 යටතේ මූලික කටයුතු ආරම්භ කර 2022.02.24 දින දක්වා මෙම නඩුව පවත්වා ගෙන ගොස් ඇති අතර, ඒ මහතා මෙම නඩුවෙන් ඉවත්ව ඇත.

මෙම කාර්මික ආරාවුල A/100/2019 යටතේ විභාග වූ බැවින්, මෙම නඩුව එකම කාර්මික ආරවුලකට හේතු වූ බැවින්ද, මෙම නඩු කටයුත්ත අවුරුදු 03 පමණ ගත වී ඇති බැවින්ද මේ දක්වා බේරුම්කරණයක් සිදු වී නොමැති හෙයින් එය ඉල්ලුම්කරුවන්ගේ හා වගඋත්තරකරුවන්ගේ එකඟතාවයෙන් A/100/2019 නඩුවේ විභාග සටහන් ලිඛිත ප්‍රකාශයක් හා නඩුවට ඉදිරිපත් කරන ලද ලකුණු කරන ලද ලේඛන හා එම ලිපි ගොනුව අංක A/45/2022 නඩුවටද අදල වන හෙයින් ඒ අනුව බේරුම්කරණය ඉදිරියටත් කර ගෙන යාමට මා විසින් කටයුතු කර ඇත.

පහත සාදාගත් දිනයක් යටතේ නඩු අංක A/100/2019 කැඳවීම් කර විභාග පවත්වා ඇත.

| | |
|---|---|
| 2020.01.14 | 2020.09.15 |
| 2020.01.21 | 2021.02.11 |
| 2020.02.25 | 2021.03.02 |
| 2020.06.23 | 2021.04.06 |
| 2020.07.14 | 2022.02.14 |
| 2020.08.11 | |

පහත සඳහන් දිනයන් යටතේ A/44/2022 යටතේ කැඳවීම් කර විභාග පවත්වා ඇත.

2022.09.05
2022.09.13
2022.09.20
2022.09.27
2022.10.03
2022.10.13

මෙම නඩුවේ ඉල්ලුම්කරුවන එච්.එස්.එල්. පෙරේරා මහතා 1984.10.22 බාටා ෂූ කම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ් ආයතනයේ කම්කරුවෙකු ලෙස සේවයට බැඳී, සේවක බාණ්ඩ 01 යටතේ ටොලාස්ටික්වරයෙකු ලෙස සේවය ආරම්භ කර ඇත. (x1) වර්ෂ 1985.05.07 දින ඔහු කම්කරුවකු ලෙස සේවයේ ස්ථිර කර ඇත. (x2)

වර්ෂ 1985 කම්කරුවන් අතර ඉහළම තත්වයට උසස් කරන ලදුව 2003.08.01 දක්වාම කම්කරු ශ්‍රේණියේ කටයුතු කර ඇත. (x3) වර්ෂ 2001.10.01 ඔහු කී ඔපරේටර්වරයෙකු ලෙස තනතුරේ උසස් වීමක් ලබා ඇත.
වර්ෂ 2003.08.01 දින මැනිපියුලන්ට් ලෙස උසස් කර ඇත. (x4) මෙම උසස් වීම නිසා ඔහු කාර්ය මණ්ඩලයේ සේවකයකුගේ තත්වය ලබා ගෙන ඇත. 2004.02.02 දින ඉල්ලුම්කරු මැනිකියුලේට් තනතුරේ සේවය ස්ථිර කර ඇත. (x5) මෙම තනතුරු තත්ව පාලක තනතුරක් වශයෙන් හැඳින්වේ. වර්ෂ 2006.06.01 දින ඔහු සුපවයිසර් තනතුර දක්වා උසස්වීම ලබා ගෙන ඇත. (x6)
මැනිපියලන්ට් තනතුර යන්න කුමක්ද කියා ඉල්ලුම්කර විසින්ම, ගරු අධිකරණයේ පැහැදිලි කර ඇත. (A/100/2019 පිටු අංක 77-78) 2020.01.15 ඉල්ලුම්කරුගෙන් ගරු අධිකරණය විසින් පහත සඳහන් ප්‍රශ්න කිරීම් කරනු ලබයි.

ප්‍ර. ඉන්පසුව ඔබට 2003 තවත් උසස් වීමක් ලැබුණා ?
උ. මැනිපියුලේට් කියන තනතුර ලැබුණා
ප්‍ර. මැනිපියුලේට් කියන්නේ මොකක් ද කියලා ගරු අධිකරණයට පැහැදිලි කරන්න.
උ. සුපවයිසර් හා සමාන සුපර්වයිසර්ට සහයෝගය දෙන තනතුරක්
ප්‍ර. එතකොට ලැබුණ රාජකාරි මොනවා ද ?
උ. දෙපාර්තමේන්තුව පාලනය කරන්න ලැබුණා.
ප්‍ර. මැනිපියුලේට් තනතුර කම්කරු තනතුරක් ද නැත්නම් කාර්යාල නිලධාරි තනතුරක්ද ?
උ. කාර්යාල නිලධාරි තනතුරක්
ප්‍ර. කම්කරුවෝ පාලනය කරන තනතුරක් ?
උ. ඔව්.

මේ අනුව ඉල්ලුම්කරු කාර්ය මණ්ඩල නිලධාරි තනතුරක් දරූ බවත්, එය කම්කරු තනතුරක් නොවන බවත්, ඉල්ලුම්කරු විසින්ම පිළිගෙන ඇත. එමෙන්ම ඉල්ලුම්කරු වන එච්.එස්.එල්. පෙරේරා මහතා කම්කරුවකු වශයෙන්, සිටියදී වෘත්තීය සමිතියක සාමාජිකයෙකු වශයෙන්, ඔහු නියෝජනය කළ වෘත්තීය සමිතිය සාමූහික ගිවිසුමක් අත්සන් කලාට පසු කම්කරුවන්ට යම් යම් ප්‍රතිලාභ ලැබෙන බව අධිකරණයේ පිළිගෙන ඇත. A/100/2019 ගොනුවේ පිටු අංක 96 අනුව ගරු අධිකරණය ඉදිරියේ 2020.06.23 දින ඉල්ලුම්කරුගෙන් දෙවන පාර්ශ්වය කරන ලද ප්‍රශ්නවලදී ඉල්ලුම්කරු පිළිගෙන ඇත.

ප්‍ර. මහත්මයා අවුරුදු 22කට ආසන්න කාලයක් මහත්මයා කම්කරුවෙක් විදිහට නේද ඉඳලා තියෙන්නේ? ඊළඟට නේද මහත්මයාට උසස් වීම ලැබුණේ ?
උ. එහෙමයි.
ප්‍ර. මහත්මයා කම්කරුවෙක් වශයෙන් ඉන්නකොට මහත්මයා වෘත්තීය සමිතියක සාමාජිකයෙක් වෙලා හිටියා කියලා මහත්මයා සාක්ෂි ලබා දීමක් කර තිබෙනවා?
උ. එහෙමයි ස්වාමිනි.

ප්‍ර. එතකොට මහත්මයා මේ වෘත්තීය සමිති සාමාජිකයෙක් විදිහට ඉන්නකොට මහත්මයාට යම්කිසි ප්‍රතිලාභ එහෙම හම්බ වෙන්න ඇති නේද?

උ. එහෙමයි.

එමෙන්ම ඉල්ලුම්කරු ඔහුගේ සාක්ෂි තුළින් ගරු අධිකරණයේ දී කාර්ය මණ්ඩල තනතුර ලැබුණාට පසුව කම්කරුවෙකු වශයෙන් සිටියදී ලද ප්‍රතිලාභ නොලැබෙන බව පිළිගෙන නැත.( පිටු අංක 98)

ප්‍ර. මහත්මයා මහත්මයාගේ සාක්ෂි වලින්ම පිළිගත්තා. සුපවයිසර් කැටගරියට ගියාම මහත්මයා මෙම වෘත්තිය සමිතියේ සාමාජිකයෙකු නොවන බවට ?

පි. පිළිගත්තා.

ප්‍ර. එතකොට මහත්මයා වෘත්තීය සමිතියේ සාමාජිකයෙකුත් නෙවෙයි. සාමූහික ගිවිසුමට සම්බන්ධ නැහැනේ. එතකොට මහත්මයා සුපර්වයිසර් කැටගරි එකට ගිහාම මහත්මයාට මේ සාමූහික ගිවිසුමෙන් ලැබෙන ප්‍රතිලාභ ලැබෙන්නේ නෑ නේද?

උ. ලැබෙන්නේ නෑ.

ඉල්ලුම්කරු විසින් 2022.09.05 දින දරන ප්‍රකාශය මගින් කියා සිටින්නේ 2004.02.02 සිට 2022 අගෝස්තු මාසය වන තෙක් වාර්ෂිකව අහිමි කළ වැටුප් ප්‍රමාණය දැක්වෙන A3 දරන ලේඛනය ඉදිරිපත් කරන බවයි. මෙම ලිපියේ 06 මගින් ඔහු කියා සිටින්නේ " වැඩ කරන සේවා නියුක්ති කළමනාකරණ ක්‍රමවේදය අනුව සේවකයෙකුට තමා කම්කරුවෙකු ලෙස සේවය කරමින් සිටිය දී කාර්ය මණ්ඩලයට (Staff) උසස් වීමේ දී ලබමින් සිටි වැටුපට වඩා වැඩි වැටුපක් ගෙවිය යුතුව තිබිය යුතු නමුත් A2 තනතුරේ ස්ථිර කිරීමෙන් පසු, මෙහි පළමු පාර්ශ්වය වූ මා හට සිදු වූයේ අහසින් හෙන පාත් වන්නාක් මෙන් මා ඒ වන විට උපයා ගෙන භුක්ති විඳිමින් සිටි වැටුප මසකට රු. 6124.24 කින් අඩු කිරීම බව මෙහි සුවිශේෂ කරුණක් ලෙසට ගරු උතුමාණන්ගේ අධිකරණයට ගෞරවයෙන් අවධාරණය කර සිටී." යනුවෙනි.

අසාධාරණය ලෙස වෙනසක් සිදු කිරීම ඉල්ලුම්කරුගේ ලිපියේ 07හි 01 යටතේ ඔහු සඳහන් කරන්නේ "මා සේවා අංක 2491 යටතේ පළමු වන ශ්‍රේණියට බැඳී සිටි අතර පසු කාලීනව 08 වන ශ්‍රේණියට බඳවා ගත් මා දරූ තනතුරේම සේවය කළ සේවා අංක 2584 හිමි ඩබ්ලිව්.ඒ.එස්.එල් පෙරේරා මහතාට 2005 අගෝස්තු මාසය වන විට ගෙවූ වැටුප රු.19980.00 වන අතර ඒ වන විට මෙහි පාර්ශවකරු වන මාගේ මූලික වැටුප රු.13,000.00 ක් බව ගෞරවයෙන් සැල කරන බවයි"

A/100/2019 ගොනුවේ පිටු අංක 100, 2020.06.23 දින මෙම නඩුවේ දි අධිකරණයේ සාක්ෂි දෙමින් ඉල්ලුම්කරු, දෙවන පාර්ශ්වයේ නීතිඥතැනගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පහත සඳහන් ප්‍රකාශ සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

ප්‍ර. එයට මහත්මයා උත්තරයක් දී තිබෙනවා. 2004 වසරේ සිට ..........................................(2022.02.25 දින කාර්ය සටහන් හි 05 වන පිටුවේ 03 වන පිළිතුර කියවා සිටී) ඒ කියන්නේ එතන මහත්මයා 2005 වර්ෂයේ වැඩි වීමක් වෙලා තියෙනවා ?

උ. වැඩිවීමක් වෙලා තියෙනවා.

ප්‍ර. 2006 වර්ෂයේ වැඩිවීමක් නෑ ?

උ. නෑ

ප්‍ර. 2007 වර්ෂයේ රු.13,000.00ට 19.23 % වැඩිවීමක් වෙලා රු.15,580.00ක් ලැබී තියෙනවා නේද?

උ. ඔව්.

ප්‍ර. ඉන් පසුව 2008 වර්ෂයේ රු.15,000.00ට 14.52 % වැඩිවීමක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ රු. 17,550.00 නේද මහත්මයා ?

උ. එහෙමයි.

ප්‍ර. 2009 වර්ෂයේ වැටුප් වැඩිවීමක් වෙලා නෑ?

උ. එහෙමයි.

ප්‍ර. මේ වැටුප් වැඩිවීමක් නැති වර්ෂවලට මහත්මයාට විතර ද මේ වැටුප් වැඩිවීම වෙලා නැත්තේ? අනික් සේවකයින්ටත් වැඩි වීමක් වෙලා නැද්ද?

උ. අනික් සේවකයින්ටත් ලැබුණේ නෑ.

ප්‍ර. ඒ කියන්නේ මහත්මයාට විතරක් මේ වැටුප් අඩු කිරීමක් කර නෑ?

උ. නෑ.

ප්‍ර. අනික් සියලුම සේවකයින්ටත් ලැබී නෑ.

උ. ඔව්.

ප්‍ර. ඒක ආයතනය විසින් ගත්තු තීරණයක් තමයි ඒ අවුරුදුවලට වැටුප් වැඩිවීමක් නොදීම?

උ. එහෙමයි.

ප්‍ර. ඊළඟට 2010 ඉඳලා 2020 අප්‍රේල් වෙනකල් වැටුප් වැඩිවීමක් වෙලා තිබෙනවා ද?

උ. 2020 ලැබුණේ නැහැ.

ප්‍ර. 2019 වෙනකල් මහත්මයාට ලැබී තිබෙනවා නේද?

උ. මේ ප්‍රශ්නය අදාළ වුනාට පසුව 2%,4% වගේ ලැබුනේ.

ප්‍ර. ඒක මහත්මයාට විතරක් නොවේනේ. සියලුම සේවකයන්ටත් එක්කම නේද එහෙම වෙලා තිබෙන්නේ.

උ. අනෙක් සේවකයන්ට ඊට වඩා වැඩියි.

ප්‍ර. මම මහත්මයාට යෝජනා කරනවා මහත්මයාට 2019 වන තෙක් ම හරියාකාරව වැටුප් වැඩිවීමක් වෙලා තිබෙනවා කියලා. මම මහත්මයාට යෝජනා කරනවා, මහත්මයාට ලැබුනේ නැති අවුරුදුවල, මහත්මයාට පමණක් නෙවෙයි. සියලුම සේවකයින්ට ලැබී නෑ කියලා.එහෙම නේද මහත්මයා? (A/100/2019 පිටු අංක 102)

උ. එහෙමයි.

ප්‍ර. "මහත්මයා හරස් ප්‍රශ්නවලදී උත්තර දීලා තියෙනවා, වර්කර් කැටගරියේ සිට සුපර්වයිසර් කැටගරියට යන විට මහත්මයාට එම ප්‍රතිලාභ ලැබෙන්නේ නෑ කියලා. මහත්මයාගේ සාක්ෂියේදී පිළිඅරන් තියෙනවා? මහත්මයාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවා. වෘත්තීය සමිති සාමාජිකයෙක් නොවී සාමූහික ගිවිසුමටත් සම්බන්ධ නෑ. සුපර්වයිසර් කැටගරියට ගියාම සාමූහික ගිවිසුමෙන් ලැබෙන ප්‍රතිලාභ ලැබෙන්නේ නෑ කියලා ප්‍රශ්නයක් අහලා තියෙනවානේ. මහත්මයා පිළිතුරු දීලා තියෙනවා ලැබෙන්නේ නෑ කියලා? (A/100/2019 ගොනුවේ පිටු අංක 111)

උ. ඔව්.

ප්‍ර. A/100/2019 ලිපි ගොනුවේ පිටු අංක 120 පහත පරිදි සටහන් ඉදිරිපත් කරමි. මහත්මයා ප්‍රකාශ කළා හරස් ප්‍රශ්න අහනකොට උත්තර දීලා තියෙනවා .කවුද මහත්තයා මේ තුන්දෙනාගේ නම් උත්තර දීලා තියෙනවා එක්කෙනෙක් අස්වෙලා ගියා එක් කෙනෙක් පෙරේරා අනෙක් කෙනා තිලකරත්න කියලා. මහත්මයාගේ උගත් නීතිඥ මහත්මයා ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අහලා තියෙනවා මහත්මයාගේ උගත් නියෝජිත මහතා අහලා තියෙනවා. සුපවයිසර් මහත්වරුන්ගේ හා ඔබගේ වැටුපේ පරස්පරතාවයක් තියෙනවා ද කියලා. මාගේ මාසික වැටුප රුපියල් දහතුන් දහසක් දහතර දහසක් කියලා කාගෙන්ද මහත්මයා මේ වෙනස වෙලා තියෙන්නේ කියලා අහලා තියෙනවා. මහත්මයා උත්තර දීලා තියෙනවා. මාත් එක්ක ප්‍රොමෝට් වුන අනිත් දෙන්නා කියලා නම් වශයෙන් පෙරේරා හා තිලකරත්න කියලා තියෙනවා.

උ. ඔව්.

පෙරේරා සහ තිලකරත්න යන දෙදෙනාගේ පත්වීම් ලිපි ඉදිරිපත් කර සීටි.

ප්‍ර. මේ දෙන්නා වර්කර් තනතුරේ ඉඳලා සුපවයිසර් මැනිපියුලන්ට් තනතුරට පත් වෙලා තියෙනවා. මෙහි උඩ ඡේද කියවන්න. (පිටු අංක 121)

උ. ඉංග්‍රීසි තේරෙන්නේ නෑ.

ප්‍ර. මහත්මයා මම කියා සිටිනවා මෙම තිලකරත්න මැනිපියුලන්ට් තනතුරට පත්වෙලා තියෙන්නේ 1997 පෙබරවාරි 03 වන දා කියලා යොමු කරලා තියෙන ලේඛනයෙත් එය තියෙනවා කියලා මම කියා සිටිනවා.

උ. මට තේරුම් ගැනීමට හැකියාවක් නෑ.

එම ලේඛනය (R4) ලෙස සලකුණු කිරීමට අවසර ඉල්ලා සිටී.ඔප්පු කිරීමට භාරයට යටත්ව ලකුණු කරන ලෙස පළමු පාර්ශ්වයෙන් ඉල්ලා සිටී.

ප්‍ර. මහත්මයාට යොමු කර සිටිනවා පෙරේරා මහත්මයාත් මහත්මයා සමග ප්‍රමෝට් වුනා කියලා. මහත්මයාට ඉදිරිපත් කරනවා පෙරේරා මහත්මයාගේ පත්වීම් ලිපිය.

උ. ඉංග්‍රීසි කියවා තේරුම් ගන්න අපහසුයි.

ප්‍ර. මෙම ලේඛනයට අනුව පෙරේරා මහත්මයාට වර්කර් කැටගරියේ සිට සුපර්වයිසර් කැටගරියට පත්වීම ලැබිලා තියෙන්නේ 1997.10.01 කියලා ?

උ. මම 97 වෙද්දී එතකොට කී ඔපරේටර් මම දෙපාර්තමේනතුවක් පාලනය කරමින් සිටියේ.

ප්‍ර. මහත්මයාට සුපර්වයිසර් කැටගරිය ලැබුනේ මොන අවුරුද්දේද?

උ. 2003

ප්‍ර. මහත්මයා මේ කාලයේ පරිවාස කාලයට යටත් වෙන්න ඇතිනේ.

උ. තේරුමක් නෑ.

ප්‍ර. පත්වීම ලැබුනේ 2004 නේ?

උ. 2004

පෙරේරා යන සේවකයාගේ පත්වීම් ලිපිය (R5) ලෙසට ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටියි. එය ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කරන ලෙස ඉල්ලා සිටී.

මේ අනුව ඩබ්ලිව්.ඒ.එස්.එල්. පෙරේරා සහ එස්.බී. තිලකරත්න යන මහතුන් ඉල්ලුම්කරු හා සමාන තනතුරක් දැරුවත් ඔවුන් දෙදෙනාම ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහළ බැව් නිරීක්ෂණ විය.

(R5)

ප්‍ර. මහත්මයා මෙම කරුණ සම්බන්ධව පඩි වැඩි වීම සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් කරලා තිබුනානේ? (පිටු අංක 123)

උ. ඔව්.

ප්‍ර. ඒ අංකය මතකයක් තියෙනවා ද? CW/COM/101/201210/45 කිව්වොත් නිවැරදිද?

උ. හරි.

ප්‍ර. ඊට පස්සේ සාකච්ඡාවකට සහභාගි වුනා ද ආයතනය එක්ක කම්කරු දෙපාර්තමේන්තුවේදී?

උ. ඔව්.
ප්‍ර. මහත්මයාට කියන්න ඇතිනේ, මේ පිළිබඳව කළමනාකාරිත්වය එක්ක සාකච්ඡා කරලා විසඳුමකට එන්නම් කියලා. මොකක්ද කිවුවේ?
උ. ලිපියක් ඉදිරිපත් කළා. වීරසිංහ මහත්මයාගෙන් හම්බ වුනේ නෑ. සාකච්ජා කරලා ප්‍රේමචන්ද්‍ර මැඩම් සමථයකට පත් කළා.
ප්‍ර. විසඳුමක් ලබා දුන්නා ද ?
උ. නෑ.
ප්‍ර. මේ ලේඛනය ලැබුනා ද?
උ. මම මේ ලිපිය භාරගත්තේ නෑ.
ප්‍ර. මේ ලේඛනය බලන්න. මෙය තේරුම් ගන්න පොඩි හරි හැකියාවක් ඇතිනේ?
උ. මම භාරගත්තේ නැති නිසා ගෙදරට එවනවා කියලා අඩු පඩිය හදලා දෙන්නම් කියලා කිවුවා.
ප්‍ර. මේ ලේඛනය අරන් තියෙනවානේ?
උ. ඔව්.
ඉල්ලුම්කරු විසින් අත්සන් කර ලබා ගන්නා ලද ලේඛනය (R8) ලෙස ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටියි
ප්‍ර. මේ සාකච්ජාවෙන් පස්සේ මහත්මයා ලියුම් ඉදිරිපත් කරලා තියෙනවා. (R8) කියලා ලේඛනයක් ලකුණු කරලා තියෙනවා. කම්කරු උසාවියේ සාකච්ජාවෙන් පසසේ මහත්මයාට වැටුප් වැඩි කිරීමක් කළාද මේ ආයතනයෙන්?
උ. රු.1,000ක් බේසික් එකට ලැබුණා.
ප්‍ර. මෙම සියලුම සාකච්ජාවලින් පස්සේ පූර්ණ සහ අවසන් සමථයක් වශයෙන් රු.2,000/-ක පඩි වැඩි කිරීමක් කළා කියලා?
උ. රු.1000ක් එලවන්ස් වැඩි කළා.
ප්‍ර. මම මහත්මයාට යෝජනා කරනවා රු.2,000ක පඩි වැඩි කිරීමක් කළා කියලා වැඩි කළාද නැද්ද?
උ. මූලික වැටුප රු. 1,000ක් එලවන්ස් රු. 1,000ක් (A/100/2019 පිටු අංක 166) අංක 2-2003 ගැසට් කරන ලද සාමූහික ගිවිසුමට (R10) ලෙස සලකුණු කිරීමට අධිකරණයෙන් ඉල්ලා සිටී.
ප්‍ර දැන් මහත්මයා මෙම (R10) ලේඛනයේ ටයිටල් කියලා කොටසක් සඳහන් වෙනවා. මෙම ගරු අධිකරණයට ටයිටල් කියන කොටස කියවා සිටින්න.
උ. (සාක්ෂිකරු එම අදාළ කොටස ඉංග්‍රීසි භාෂාවෙන් කියවා සිටී.)
ප්‍ර. මොකක් ද මහත්මයා ඒ කරුණ.එහි සිංහල අර්ථය මොකක් ද? ඒ ශීර්ෂය අනුව ඒ සාමූහික ගිවිසුම අදාළ වන්නේ තුමන සේවා පාර්ශවයකටද?
උ. කම්කරු ශ්‍රේණියට.
ප්‍ර. මෙම ගැසට් කරන ලද සාමූහික ගිවිසුම සුපර්වයිසර් කැටගරි එකට අදාළ වනවා ද?
උ. එසේ නොවේ.
ප්‍ර. එතකොට මුල් කොටසේ සඳහන් වන්නේ මොකක් ද? මෙම පුනරාවර්ථනය නොවන ජීවන වියදම් පාරිතෝෂිකය අදාළ වන්නේ කාටද?
උ. (එම අදාළ කොටස කියවා සිටියි.)
ප්‍ර. ඒ අනුව මෙම පුනරාවර්ථනය නොවන ජීවන වියදම් පාරිතෝෂිතය අදාළ වන්නේ මැනුවල් හා ලේබර් කැටගරිවලට?
උ. ඔව්.

මෙම අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද එම ශීර්ෂයේ කොටස (R10) (A) වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කරන ලදී.
(A/100/2019 පිටු අංක 168)

ප්‍ර. මෙම ගැසට් කරන ලද සාමුහික ගිවිසුම සුපර්වයිසර් කැටගරි එකට අදාළ වනවාද?
උ. එසේ නොවේ.
ප්‍ර. ඊට අමතරව මහත්මයා මෙම R10 ගැසට් කරන ලද සාමූහික ගිවිසුමේ 07 වන වගන්තිය වෙත මහත්මයාගේ අවධානය යොමු කරනවා. මේ 07 වගන්තියෙන් මොකක්ද මහත්මයා සඳහන් වෙන්නේ?
පි. එම කොටස ඉංග්‍රීසි භාෂාවෙන් කියවා සිටී.
ප්‍ර. ඒ කියන්නේ පුනරාවර්ථන නොවන ජීවන වියදම් පාරිතෝෂිකය?
උ. ඔව්.
ප්‍ර. එතකොට මුල් කොටසේ සඳහන් වෙන්නේ මොකක්ද? මෙම පුනරාවර්ථනය නොවන ජීවන වියදම් පාරිතෝෂිකය අදාළ වන්නේ කාට ද?
උ. (අදාළ එම කොටස කියවා සිටී.)
ප්‍ර. ඒ අනුව පුනරාවර්ථනය නොවන ජීවන වියදම් පාරිතෝෂිකය අදාළ වන්නේ මැනුවල් හා ලේබර් කැටගරි වලට?
උ. ඔව්.
ප්‍ර. මෙතන කොතනකවක් සඳහන් වනවා ද සුපවයිසර් කැටගරි කියලා?
උ. නැහැ.

මේ අනුව නිරීක්ෂණය වන්නේ සුපරීක්ෂක තනතුරේ සිටින සේවකයෙකුට සාමූහික ගිවිසුමෙන් ලැබෙන ප්‍රතිලාභ නොලැබෙන බවයි. (A/100/2019 169 පිටු)

ප්‍ර. මහත්මයා A-5 ලේඛනය ලකුණු කොට තියෙන්නේ ඉල්ලුම්කරු නේද?
පි. ඔව්. සේවක පාර්ශ්වය
ප්‍ර. එතකොට මේ A-5 කියන ලේඛනයේ සඳහන් වෙනවා අපෑඩ් ඇවරේජ් රේට් 570 කියලා කොටසක් සඳහන් වෙලා තියෙනවා. මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න පුලුවන් ද?
පි. ඔව්.
ප්‍ර. මොකක්ද ඒ කියලා පැහැදිලි කරන්න.
(A/100/2019 170 පිටුව)
පි. අපෑඩ් ඇවරේජ් රේට් 570 කියලා මෙම සේවකයා එදිනට රාජකාරිය සඳහා වාර්තා නොකලොත් පමණක් මෙම 570.29 කියන රේට් එක ලැබෙන්නේ යම්කිසි විධියකින් මෙම සේවකයා නිවාඩු ගියහොත් හෝ රජයේ නිවාඩු දවසක් ඒ සතිය තුළ යෙදිලා තිබුනහොත් හෝ මෙම දීමනාව ලැබෙන්නේ නෑ. ඊට වඩා අඩු දීමනාවක් තමයි ලැබෙන්නේ.
ප්‍ර. එතකොට දැන් මෙම ඉල්ලුම්කරු විසින් මෙතන 570 ලෙස කරලා තියෙන එක නිවැරදිද?
පි. නෑ
ප්‍ර. එතකොට මහත්මයා මෙතන කෝලා කියලා කොටසක් සඳහන් වෙලා තියෙනවා.මහත්මයාට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න හැකිද?
පි. සම්පූර්ණ කෝලා දීමනාව සඳහන් කරලා තියෙනවා.
ප්‍ර. ඒ නිවැරදිද මහත්මයා මේ කෝලා කියන මුදල් ප්‍රමාණය ලැබිය යුත්තේ මැනුවල් කැටගරි ඉන්න සේවකයන්ටද, නැතිනම් සුපවයිසර් කැටගරි ඉන්න සේවකයන්ටද?
පි. මැනුවල් කැටගරි ඉන්න සේවකයින්ට.
ප්‍ර. සුපවයිසර් කැටගරි එකට ලැබෙනවාද?
පි. නැහැ.

කෙසේ වෙතත් කම්කරුවකු වශයෙන් සිටියදී වෘත්තීය සමිතිය හා පාලක පක්ෂය අතර ඇති කරගනු ලබන සාමූහික ගිවිසුමෙන් ලද ප්‍රතිලාභ කිසිවක් ඔහු කාර්ය මණ්ඩල තනතුරකට පත් කිරීම නිසා එම පත් වූ දින සිට නොලද බව ගරු අධිකරණය ඉදිරියේ 2020.06.23 දින දෙවන පාර්ශ්වය විසින් කරන ලද හරස් ප්‍රශ්න විමසීමේදී තහවුරු වී ඇත. (පිටු අංක 98)

ඔහු කාර්ය මණ්ඩල සේවකයකු වශයෙන් මසකට රු.6124.24කින් අඩු කිරීම විශේෂ කරුණක් හැටියට ගරු අධිකරණයට අවධාරණය කරන බවයි. මෙම අඩුවීම ඔහු සසඳ ඇත්තේ ඔහු කම්කරුවකු වශයෙන් ලබාගත් වැටුප සමඟ බව පෙනී යයි. එනම් සියලුම කෝලා දීමනාව (NRCOLG-NOW Recovery Cost Of Living Gratuity) සුපවයිසර් කාණ්ඩයට අදළ නොවන නිසා අදළ දීමනා 2004 පෙබරවාරි මාසයෙන් අවසන් වී ඇති බව තහවුරු වී යයි.

ඉල්ලුම්කරුගේ මූලික වැටුපට අදළව වැටුප් වැඩි වීම වර්ෂ පිළිවෙලින් ගත්විට

| වර්ෂය | සියයට | වර්ෂය | සියයට |
|---|---|---|---|
| 2005 | 13.4% | 2012 | නැත. |
| 2006 | නැත. | 2013 | 7% |
| 2007 | 19.23% | 2014 | 6% |
| 2008 | 14.52% | 2015 | 10% +3.2% |
| 2009 | නැත. | 2016 | 4.39% |
| 2010 | 4.79% | 2017 | 2% |
| 2011 | 4.84% | 2018 | 4% |
| | | 2019 | 2% |
| | | 2020 | නැත. |
| | | 2021 | 3.5% |
| | | 2022 | 6% |

එමෙන්ම බාටා සමාගම විසින් එච්.එස්.එල්. පෙරේරා මහතාට වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණ හා අවසාන එකඟතාවයක් වශයෙන් වැටුප් වැඩි කර ඇති අතර දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ " B "දරණ 2014.12.03 දරන ලිපියෙන් ඒ බව ඔහුට දන්වා ඇති අතර එම ලිපිය භාරගත් බව 2014.12.09 වන දින එච්.එස්.එල්. පෙරේරා මහතා තම අත්සන තබා ඇත.

(A/100/2019 පිටු අංක 16)

(A/100/2019 පිටු අංක 110)

ප්‍ර. මහත්මයා ඇවරේජ් මන්ත්ලි සැලරි කියලා සඳහන් වනවා. රු.12,261.27 යමින් සඳහන් වෙලා තියෙනවා. සී කෝලා කියලා 100% කියලා 5238/-ක් කෝලා කියන ඇඩ් එක කරලා මේ ලේඛණය ගණන් කිරීම කරලා තියෙන්නේ.

පි. සර්විස් එලවන්ස් එකක් එක්ක.

ප්‍ර. ඒ කියන්නේ සර්විස් එලවන්ස් එකත් මහත්තයා හම්බ වෙන්නේ වර්කර් කැටගරියට?

පි. ඔව්.

ප්‍ර. මම මහත්තයාට යෝජනා කරනවා සර්විස් එලවන්ස් එක කෝලා කියන එකයි දෙකම ලැබිලා තියෙන්නේ, සාමූහික ගිවිසුමේ සඳහන් වගන්ති අනුව කියලා

පි. මම පිළිගන්නේ මාගේ වැටුප මාගේ උසස් වීමට අනුව ලැබෙන්න ඕන කියලා.

ප්‍ර. මෙය සාමූහික ගිවිසුමෙන් ලැබිලා තියෙන්නේ.

පි. සාමූහික ගිවිසුම ගැන දැනුවත් නෑ. මට දෙයක් අහිමි වීම ගැන කියන්නේ

ප්‍ර. මම මහත්මයාට යෝජනා කරනවා මෙම කෝලා එකයි සර්විස් එලවන්ස් එකයි දෙකම ලැබෙන්නේ සාමූහික ගිවිසුමේ කරුණු අනුව කියලා.

පි. පිළිගන්න බෑ.

ප්‍ර. මහත්මයා හරස් ප්‍රශ්නවලදී උත්තර දීලා තියෙනවා වර්කර් කැටගරියේ සිට සුපවයිසර් කැටගරියට යන කොට මහත්තයාට එම ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ කියලා මහත්මයාගේ සාක්ෂියේදී පිළි අරන් තියෙනවා. මහත්මයාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවා වෘත්තීය සමිතියේ සාමාජිකයෙකුත් නොවේ. සාමූහික ගිවිසුමටත් සම්බන්ධ නෑ. සුපවයිසර් කැටගරියට ගියාම සාමූහික ගිවිසුමෙන් ලැබෙන ප්‍රතිලාභ ලැබෙන්නේ නෑ නේද කියලා ප්‍රශ්නයක් අහලා තියෙනවානේ මහත්මයා පිළිතුරක් දීලා තියෙනවා ලැබෙන්නේ නෑ කියලා.

පි. ඔව්.

නිරීක්ෂණයන් හා නිගමනයන්

ඉල්ලුම්කරු වන එච්.එස්.එල්. පෙරේරා මහතා 1984.10.22 වන දින බාටා ෂූ කම්පැනි ඔෆ් සිලෝන් ලිමිටඩ් සමාගමේ කම්කරුවකු වශයෙන් සේවයට බැඳී ඇත. ඔහුගේ සම්පූර්ණ සේවා කාලය 2022.08.26 වන දිනට අවුරුදු 40ක් පමණ වේ. මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරන විභාගයේ දී ලිඛිත සැලකිරීම් හා කාර්ය සටහන්වල ඇතුළත් දෙපාර්ශ්වය විසින් ම මෙහෙය වන ලද සාක්ෂි විභාග පටිපාටිය හා වරින්වර මෙම දෙපාර්ශවයෙන් ඉදිරිපත් කළ විරෝධතා හා ලිඛිත සැලකිරීම් දෙපාර්ශ්වයටම අවසන් ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් එම ඉදිරිපත් කළ කරුණු මා විසින් පරිශීලනය කරන ලදී. එමෙන්ම අවසන් වරට පරීක්ෂණය පැවැත්වූ මා විනිශ්චය අධිකාරියක් වශයෙන් නිරීක්ෂණය කළ කරුණු සමග ඒ සියල්ල සලකා බලමින් මෙම කාර්මික ආරාවුලට අදාල වූ සියලු කරුණු වල සමස්ථභාවය මාගේ තීරණය ප්‍රකාශයට පත් කිරීමට පදනම් කර ගත් බව සඳහන් කරමි.මෙම සියලු කරුණු මැදහත්ව සලකා බැලීමෙන් පසුව මෙම නඩුවේ ඉල්ලුම්කරු වන එච්.එස්.එල්. පෙරේරා මහතා කම්කරුවකු වශයෙන් ද වෘත්තීය සමිතියක සාමාජිකයෙකු වශයෙන් ද සාමූහික ගිවිසුම අනුව ලද ප්‍රතිලාභ ඔහු කාර්ය මණ්ඩලයට උසස් වීමෙන් පසු නොලැබීම, ඔහු විසින්ම වැටුප් අඩු කිරීමක් ලෙස අර්ථ කථනය කර ඇත. කාර්ය මණ්ඩල තනතුර ලැබීමෙන් පසු ඔහු වෘත්තීය සමිති සාමාජිකයෙක් නොවන අතර ඒ මතම ඔහුට සාමූහික ගිවිසුම අදල නොවේ. ඒ නිසා එම ප්‍රතිලාභ ඔහුට නොලැබෙන බවට ඔහු විසින්ම අධිකරණයේ පිළිගෙන ඇත.

එමෙන්ම ඉල්ලුම්කරු වන එච්.එස්.එල්. පෙරේරා මහතා විසින් කාර්ය මණ්ඩලයේ එකම තනතුරේ සේවය කරන ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු දෙදෙනෙකුට තමාට වඩා වැඩි වැටුප් ලබන බවට චෝදනා කළත්. එම සේවකයන් දෙදෙනා පිළිවෙලින් එම උසස්වීම් ලබා ඇත්තේ, එච්.එස්.එල්. පෙරේරා මහතා 1997.10.01 සිට සුපවයිසර් කැටගරියට උසස්වීම් ලබා ඇති අතර, එස්.බී. තිලකරත්න මහතා මැනිපියුලන්ට් තනතුරට පත්ව ඇත්තේ 1997.02.03 වන දිනය. ඉල්ලුම්කරු වන එච්.එස්.එල්. පෙරේරා මහතාට එම තනතුර ලැබී ඇත්තේ 2003 වර්ෂයේ වන අතර සේවය ස්ථිර කර ඇත්තේ 2004.02.02 වන දින සිටය. මේ අනුව ඉල්ලුම්කරුට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු අයට වැඩි වැටුප් ගෙවනවා යැයි ඉල්ලුම්කරු නැගූ මතය අධිකරණයේ දී ඔප්පු වී නොමැත.

ගැසට් කරන ලද සාමූහික ගිවිසුමේ 2- 2003 හා (R10) මෙම ගැසට් කරන ලද ගිවිසුමේ 07 වන වගන්තිය අනුව පුනරාවර්තනය නොවන ජීවන වියදම් පාරිතෝෂිකය අදාල වන්නේ මැනුවල් හා ලේබර් යන කැටගරි වලට බව සඳහන් වන අතර, 2021.02.11 වන දින දෙවන පාර්ශ්වය විසින් ගරු අධිකරණයේ ඔප්පු කර ඇති අතර, ඉල්ලුම්කරු ද එය පිළිගෙන ඇත.

මේ අනුව ඉල්ලුම්කරු විසින් සාමූහික ගිවිසුමේ ප්‍රතිලාභ කාර්ය මණ්ඩල තනතුර දැරීමේදී නොලැබෙන බව පිළිගෙන ඇත. මෙම නොලැබීම වැටුප් අඩු කිරීමක් වශයෙන් ඉල්ලුම්කරු දරන මතයත් ඒ අනුව කරනු ලබන ඉල්ලීම් නිවැරදි නොවන බව නිගමනය කරමි. මේ අනුව ඉල්ලුම්කාර එච්.එස්.එල්. පෙරේරා මහතා විසින්

1. අඩු වැටුප් ලබා දීම
2. මාසික වැටුප අඩු කිරීම
3 වැටුප් පරිමාණය වැඩි නොකිරීම

යන කරුණ සම්බන්ධයෙන් ගරු අධිකරණය විසින් ඉල්ලුම්කරු ඉදිරිපත් කළ කරුණු සැලකිල්ලට ගත් විට එම කරුණු අධිකරණයේ ඔප්පු කිරීමට ඉල්ලුම්කරු වන එච්.එස්.එල්. පෙරේරා මහතා අපොහොසත් වී ඇති අතර, එම කරුණු පදනම් විරහිත බව තහවුරු වූ අතර එච්.එස්.එල්. පෙරේරා මහතාට බාටා ෂූ කම්පැණි සිලෝන් ලිමිටඩ් සමාගමෙන් ඉහත කරුණු වලට අදාළව අසාධාරණයක් සිදු වී නොමැති බව ගරු අධිකරණයේදී තහවුරු කරන ලදී. එම සමාගමේ කාර්යය මණ්ඩල සාමාජිකයකු එච්.එස්.එල්. පෙරේරා මහතාට උසස් වීමට අදාළව පහත සඳහන් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ලබා ඇති බව තහවුරු විය.

නිෂ්පාදන දිරිගැන්වීමේ දීමනා/ පැමිණීමේ දීමනා/අමතර ප්‍රවාහන දීමනා, සංග්‍රහ දීමනා/බෝනස් දීමනා/දෛනික වියදම් ප්‍රතිපූරණය/සමාගමේ ලාභාංශ/ වෛද්‍ය දීමනා ප්‍රතිපූරණය/ දින 14 වැටුප් සහිත නිවාඩු වරප්‍රසාදය තවද සේවක අර්ථසාධක ගෙවීම, ක්‍රමානුකූලව සිදු වී ඇති 2022.09.20 වගඋත්තරකරුවන් අධිකරණයේදී සඳහන් කර ඇත.

ප්‍රදානය

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින් ම පිළිගැනෙන යුක්ති සහගත හා සාධාරණ නිගමනයන් වශයෙන් කිසිදු ප්‍රදානයක් කිරීමට හේතු සාධක නොමැති බැවින් එවැනි නිගමනයන්ට නොඑළඹෙමින් මෙම අයදුම්පත ප්‍රතික්ෂේප කරමි.

ඒ.බී. හේරත්,
බේරුම්කරු.

2022 නොවැම්බර් මස 21 දින
කාර්මික අධිකරණයේ දීය.

EOG 12-0326

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.